ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வட மேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල / மாகாண சபை அலுவலக தொகுதி, குருநாகல் / Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය / தாபனமும் நிர்வாக பிரிவு / Establishment and Administration Division

මගේ අංකය / எனது இல / My No : NWP/CS/AD/1/15/1/2020
ඔබේ අංකය / உமது இல / Your No :
දිනය / திகதி / Date : 2021.09. 15

ආණ්ඩුකාරවර ලේකම් වයඹ පළාත් සභාව,
සභා ලේකම් - වයඹ පළාත් සභාව,
ලේකම් - වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම වයඹ පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම වයඹ පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම වයඹ පළාත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත.

**චක්‍රලේඛ වයඹ පළාත් සභාවට අදාල කිරීම.**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛය වයඹ පළාත් සභාවට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2021.08.13 දින ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක : NWP/GOV/AD/01/01/01/17 සහ 2021.08.16 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

02. තවද එම චක්‍රලේඛයේ අනු අංක:07 යටතේ ඇති කරුණු වෙනුවට 2021.08.09 දින පැවැති වයඹ පළාත් සභා ලේකම්වරුන්ගේ රැස්වීමේ දී ගනු ලැබූ තීරණය පරිදි "පැමිණීම හා පිටවීම සලකුණු කිරීම සඳහා සාමාන්‍ය පරිදි සලකුණු යන්ත්‍රය භාවිතා කළයුතු අතර ප්‍රවාහන අපහසුතා පවතින නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමේ වේලාවන් සම්බන්ධයෙන් පෞද්ගලිකව පරීක්ෂාකර බලා සාධාරණ හේතුමත අවශ්‍ය සහන සැලසීම සහ ඒ සඳහා ලේඛනයක් නඩත්තු කිරීම" යන්න ලෙස සංශෝධනය කිරීමටද ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය 2021.09.02 දින ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක : NWP/GOV/AD/01/01/01/17 සහ 2021.09.02 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

02. මෙම චක්‍රලේඛ, www.pubad.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කර අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

| අනු අංකය | චක්‍රලේඛ අංකය සහ දිනය | විස්තරය |
|---|---|---|
| 01 | රා.ප.ච.ලේ.02/2021(IV) හා 2021.08.06 | රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම |

අයි.කේ.එම්.එම්.එල්.තිලංගසේකර,
සහකාර ප්‍රධාන ලේකම් II (ආයතන).

අ/කළේ: පී.බී.එම්.සිරිසේන,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.